තොරතුරු මාසිකය

2023 ඔක්තෝබර්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

# විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ආර්ථිකය හැකිළීම හා සංවර්ධනය

**ශ්‍රී ලංකා ආර්ථිකය දිගින් දිගටම අර්බුදයට යමින් පවතින බව නැවත නැවතත් තහවුරු කෙරෙමින් පවතී. අයි.එම්.එෆ්. කණ්ඩායමේ නවතම වාර්තාවට අනුව දෙවන කාර්තුවේද ආර්ථිකය 3.1%කින් හැකිළී ඇති බව සඳහන් වේ. එලෙසම ඔවුන් බලාපොරොත්තු වූ පරිදි විදේශ සංචිත ඉහළ යාමද සිදුවී නොමැති බව ඔවුන්ගේ අදහසයි.**



දැඩි ආර්ථික අර්බුද තත්ත්වය යටතේ ලබාගත් නිෂ්පාදනයවත් රට සාමාන්‍ය තත්ත්වයේ යැයි පවසන වපසරියක් තුළ පවා ලබා ගැනීමට නොහැකිවීම මෙම ආර්ථිකයේ කඩාවැටීම මනාව පෙන්නුම් කරන්නකි.

ඒ අනුව බලන කල ලංකාවේ ආර්ථිකය තව දුරටත් පැරණි උපක්‍රම මඟින් ගොඩගත නොහැකි බවට තහවුරු වෙමින් පවතී. නිෂ්පාදන ක්ෂේත්‍රයේ කඩාවැටීම මඟින්ද, කාර්මික අංශයේ නිෂ්පාදන තව දුරටත් අඩුවීම මඟින්ද පෙන්නුම් කරනු ලබන්නේ මෙම කඩාවැටීමයි. ශ්‍රී ලංකා මහ බැංකු මාසික වාර්තාවලට අනුව පහත සඳහන් වන්නේ පසුගිය අර්ධ වාර්ෂිකයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදනවල තත්ත්වයයි.

ඉහත සංඛ්‍යාලේඛනවලට අනුව තේ සහ රබර් නිෂ්පාදනය ඉහළ ගොස් නැති අතර, පොල් නිෂ්පාදනය 7.9%කින්ද, මාළු නිෂ්පාදනය 3.8%කින්ද, වී නිෂ්පාදනය 34.11%කින්ද කඩාවැටී ඇත.

| 2023 ජනවාරි සිට ජුනි දක්වා ප්‍රධාන කෘෂි නිෂ්පාදන | | | |
|---|---|---|---|
| **වර්ගය** | **2022** | **2023** | **වෙනස%** |
| **තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන** | 133.30 | 134.10 | 0.60 |
| **රබර් නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන** | 36.70 | 37.10 | 1.20 |
| **පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන** | 1,706.00 | 1,572.00 | -7.9 |
| **මාළු නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන** | 200.00 | 192.40 | -3.8 |
| **වී නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන** | 5,149.60 | 3,392.90 | -34.11 |

| 2023 මුල් මාස හය තුළ කාර්මික නිෂ්පාදන දර්ශකය පෙන්නුම් කරන කඩාවැටීම (ප්‍රතිශතයක් ලෙස) | |
|---|---|
| **ආහාර නිෂ්පාදන** | -10.9 |
| **පාන වර්ග** | -1.4 |
| **දුම්කොළ නිෂ්පාදන** | -1.8 |
| **ඇඟලුම් කර්මාන්තය** | -2.1 |
| **පැළඳුම් නිෂ්පාදන** | -9.6 |
| **කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන** | -27.7 |
| **රසායනික නිෂ්පාදන** | -29.3 |
| **රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන** | -14.9 |
| **ඛනිජ නිෂ්පාදන** | -29.1 |
| **විදුලි කාර්මික උපකරණ** | -10.8 |
| **යන්ත්‍ර සහ උපකරණ** | -6.7 |

ශ්‍රී ලංකා මහ බැංකු මාසික වාර්තාවලට අනුව මේ ආකාරයටම කාර්මික නිෂ්පාදන අංශයේද 2022 2022 මුල් මාස හයෙහි පැවැති වසරට සාපේක්ෂව 2023 මුල් මාස හය තුළ අංශ ගණනාවකින් කඩාවැටී ඇත. එය කාර්මික නිෂ්පාදන දර්ශකය මඟින් පිළිබිඹු වේ.

ඉහත සංඛ්‍යාවලට අනුව කාර්මික නිෂ්පාදන සමස්ත මිල දර්ශකය 6.7%ක කඩාවැටීමක් පෙන්නුම් කරන අතර එහි විශාල කොටසක් ආනයන සීමා කිරීම නිසා සිදුවී ඇති බව පැහැදිලිය. ඒ අතර කඩදාසි නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, විදුලි කාර්මික නිෂ්පාදන සහ රසායනික නිෂ්පාදන විශාල ලෙස අඩුවීම මඟින් එය තව දුරටත් තහවුරු කෙරේ.

එලෙසම දළ දේශීය නිෂ්පාදනයට දක්වන ආංශික දායකත්වයද මුල් කාර්තුව තුළ පහළ ගොස් ඇති ආකාරය පහතින් දැක්වේ.

| **විස්තරය** | **2022** | **2023** |
|---|---|---|
| **කෘෂිකාර්මික** | 25.0 | 26.7 |
| **කාර්මික** | 27.9 | 25.5 |
| **සේවා** | 47.1 | 47.8 |

ඒ අනුව කාර්මික අංශයේ දායකත්වය 2.4%කින් අඩුවී ඇති අතර, එය අනෙකුත් අංශ දෙක අතර බෙදී ගොස් තිබේ.

මේ සියලු සංඛ්‍යා තවදුරටත් තහවුරු කරමින්, පළමු කාර්තුව තුළ සේවා වියුක්ති අනුපාතය 2022 මුල් කාර්තුවේ 4.3%ක් වී තිබූ අතර එය 2023 මුල් කාර්තුවේ 4.7%ක් දක්වා ඉහළ ගොස් තිබිණි. ඒ අතරම රැකියා සහ පිටරට පදිංචිය වෙනුවෙන් මුල් මාස 06 තුළ 6,83,363ක් ලංකාවෙන් පිටව ගොස් තිබිණි. මේ සියලු කාරණා සමඟ සසඳන විට ආර්ථික අර්බුදය තවදුරටත් තීව්‍ර වෙමින් පවතින බව පැහැදිලිය.

# ඉන්දියා - ශ්‍රී ලංකා නව ආර්ථික ගිවිසුමක්?

ඉන්දියාව දකුණු ආසියාවේ බලවත් රාජ්‍යය ලෙසින් කලාපීය රාජ්‍යයන් කරා තම ආර්ථික, යුදමය, සංස්කෘතික, දේශපාලන ආදී ලෙසින් සෑම ක්ෂේත්‍රයකම බලය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම ඉතිහාසය පුරාම දක්නට ලැබෙන කරුණකි. එහිදී මූලිකම වශයෙන් තම ආර්ථික ආධිපත්‍යය පැතිරවීමෙහිලා ආසන්නතම රාජ්‍යයක් ලෙසින් ශ්‍රී ලංකාව ගොදුරු කර ගැනීම සඳහා විවිධ ප්‍රවේශයන් කරළිගත වේ. සහයෝගීතා, ද්විපාර්ශ්වික ආදී නම්වලින් පැමිණි 'සප්තා' (SAFTA), 'සීපා' (CEPA) ගිවිසුම් මෙහිදී සිහිපත් වේ. ඒවා ක්‍රියාවට නැඟීමේදී ඒ ඒ මොහොතවල්වලදී ඇතිවුණු විරෝධතා, සංවාද ආදිය නිසා සමස්තයක් ලෙස එකවර ගොදුරු කර ගැනීම්වලට ඉඩකඩ විවර නොවූව ද, ක්‍රමිකව වෙනත් ආකාරවලින් ඒවා දැනුදු ක්‍රියාත්මක වේ. එහෙත්, සම්පූර්ණ නොවූ පෙර එකඟතා සහ යළි යළිත් ඉන්දියානු ආර්ථිකයෙහි වර්ධනයන් අරභයා පෙර සීමාවලට ඔබ්බෙහි වන අවශ්‍යතා වෙනුවෙන් ඒ සඳහා වන නව ප්‍රවේශයන් හඳුනාගත යුතුව තිබේ.

පසුගිය ජූලි මස 21 වැනි දින රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ ඉන්දියානු සංචාරය අතරතුර රනිල් වික්‍රමසිංහ සහ නරේන්ද්‍ර සිං මෝදි අග්‍රාමාත්‍යවරයා අතර හමුව අවධානයට ගත යුත්තේ ඒ අනුව ය. සුපුරුදු පරිදි එහිදී නායකයෝ දෙපළ එම හමුව රටවල් දෙකේ ඓතිහාසික සබඳතා තහවුරු කෙරෙන අවස්ථාවක් බව පැවසූහ. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණපා සිටින ආර්ථික අර්බුදයේදී ඉන්දියාව ලබා දෙන නොමසුරු සහයෝගය, උපකාර, අවධානය පිළිබඳව ස්තුතිය රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විශේෂයෙන් පළ කළ අතර, ඉදිරියටත් ඉන්දියාවේ සහාය, ආයෝජන අවශ්‍ය බවට පුන පුනා කරුණු දැක්වී ය.

ක්ෂේත්‍ර ගණනාවක් සම්බන්ධයෙන් මෙවර ඔවුන් විසින් එළැඹි එකඟතාවල ප්‍රකාශිත කරුණු මෙසේ ය:

✧ **සමුද්‍ර සබඳතා (Nautical Connectivity):**

කලාපීය මෙහෙයුම් සහ නැව්ගත කිරීම් ඒකාබද්ධ කිරීමේ අදහසින් ශ්‍රී ලංකාවේ කොළඹ, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරේ වරායවල සැකැසුම් සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් සහයෝගීතාවෙන් කටයුතු කිරීම.

ඉන්දියාවේ නාගපට්ටිනම් හා කන්කසන්තුරය අතර, ඉන්දියාවේ රාමේශ්වරම් හා තලෙයිමන්නාරම අතර සහ එකඟවූ අනෙක් ස්ථාන අතර මඟී යාත්‍රා, පාරු සේවා ඉක්මනින් ආරම්භ කිරීම.

✧ **ගුවන් සබඳතා (Air Connectivity):**

යාපනය සහ චෙන්නායි අතර ගුවන් සේවා ඇරැඹීම ප්‍රවර්ධනය කිරීම. එය කොළඹ දක්වා දිගු කිරීම. තවද, ත්‍රිකුණාමලය හා මඩකලපුව ද එයට සම්බන්ධ කිරීම සහ හඳුනා ගන්නා රටේ තවත් ස්ථාන දක්වා ගුවන් සේවා ව්‍යාප්තිය.



සිවිල් සහ ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි ආයෝජනය හා සහයෝගීතාව වර්ධනය කිරීම සහ පලාලි ගුවන්තොටුපොළෙහි යටිතල පහසුකම් දියුණු කිරීම.

ඉන්දියාව ශීඝ්‍රයෙන් අත්පත් කර ගත් ඩිජිටල් තාක්ෂණික දියුණුව, ඒ හා බැඳුණු යටිතල පහසුකම් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ පරිපාලන ක්ෂේත්‍රවල වර්ධනය සඳහා භාවිත කිරීම. පුරවැසි කේන්ද්‍රීය, ඵලදායී හා කාර්යක්ෂම සේවාවන් ලබාදීම වෙනුවෙන් යොදා ගැනීම.

✧ **අන්තර් පුද්ගල සම්බන්ධතා (People to People Connectivity):**

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය මූලික කරගෙන ඉන්දියානු බෞද්ධ සමාජය දැනුම්වත් කිරීම සහ ඔවුන් අතර සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකාව හා බැඳුණු රාමායන කතාව ප්‍රචලිත කිරීම. ලංකාව තුළ ඇති බෞද්ධ, හින්දු සහ අනෙකුත් ආගමික පැරැණි ස්ථාන ප්‍රවර්ධනය සහ ප්‍රචලිත කිරීම.

දෙපාර්ශ්වයේම අධ්‍යාපන ආයතනවල සහයෝගීතාව මත නව උසස් අධ්‍යාපන ආයතන සහ නිපුණතා ප්‍රවර්ධන අධ්‍යාපන ආයතන ලංකාව තුළ ස්ථාපනය කිරීම. මෙහිදී ලංකාවේ අධ්‍යාපන අවශ්‍යතාව සහ අනුකූලභාවයට ප්‍රමුඛතාව දෙනු ඇත.

කෘෂිකර්ම, ජල ජීවී වගාව, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර සහ මූල්‍ය කළමනාකරණය, සෞඛ්‍යය සහ වෛද්‍ය විද්‍යාව, අභ්‍යවකාශ විද්‍යාව මෙන්ම ඉතිහාසය, සංස්කෘතිය, භාෂා සාහිත්‍යය, ආගමික කටයුතු අධ්‍යයනය සහ වෙනත් ක්ෂේත්‍ර පරීක්ෂණ සහ අධ්‍යාපන ආයතන අතර පුළුල් සහයෝගීතාවක් ඇති කිරීමට කටයුතු කිරීම මෙන්ම අන්‍යෝන්‍ය අවශ්‍යතා මත පදනම්ව කටයුතු කිරීම.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගොඩබිම් සබඳතාවක් ඇති කිරීමට කටයුතු කිරීම. එහිදී ත්‍රිකුණාමලය වරාය සහ කොළඹ වරාය අතර ගෙඩබිම් ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම. ඉහත මාර්ග ප්‍රවේශ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් පළමුව සිදු කිරීම.

✧ **වෙළෙඳ, ආර්ථික සහ මූල්‍ය සම්බන්ධතා (Trade, Economic and Financial Connectivity):**

(අ) දෙරට අතර ආයෝජනවල පුළුල් කිරීම.

(ආ) විවිධ අංශවල රජය සතු ව්‍යාපාරවලට ඉන්දියානු ආයෝජන ගෙන ඒම.

(ඇ) ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම් ඇති කර ගැනීම. ඉන්දියානු රුපියල දෙරට අතර හුවමාරු මුදල් ඒකකයක් ලෙස පිළිගැනීම.

(ඈ) ඩිජිටල් මහජන යටිතල පහසුකම් (Digital Public Infrastructures) ලංකාවේ වුවමනාවට අනුව ලබා දීම.

✧ **බලශක්ති සහ බලශක්ති සම්බන්ධතා (Power and Power Connectivity):**

පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීම. විශේෂයෙන් සුළං සහ සූර්ය බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීමෙන් 2030 වන විට ලංකාවේ බලශක්ති අවශ්‍යතාවෙන් සියයට 70ක් එම ක්ෂේත්‍රයෙන් ලබා ගැනීමට කටයුතු කිරීම.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඉහළ ධාරිතාවෙන් යුත් විදුලි ජාල සම්බන්ධතා ඇති කිරීම. එමඟින් ලංකාවේ නිෂ්පාදිත විදුලිය ඉන්දියාවට පමණක් නොව කලාපයේ වෙනත් රටවලට ද අලෙවි කොට විදේශ විනිමය ඉපැයීමට හැකියාව ලබා ගැනීම.

සාම්පූර් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සහ ස්වාභාවික ද්‍රව වායු (LNG) උත්පාදනය සඳහා යටිතල පහසුකම් ප්‍රවර්ධනය ගිවිසුමට අනුව කටයුතු කිරීම. එහිදී හරිත හයිඩ්‍රජන් සහ හරිත ඇමෝනියා බලශක්ති නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.


දැනට ක්‍රියාත්මක වන ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණ ව්‍යාපෘති අන්‍යෝන්‍ය අවශ්‍යතා සඳහා වාසිදායක තත්ත්වයන් යටතේ ඉදිරියට කරගෙන යාම. ජාතික සහ ජාත්‍යන්තර කාර්මික මධ්‍යස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය සංවර්ධනය කිරීම.

මෙම එකඟතාවන් කඩිනමින් ක්‍රියාවට නැඟීමට දෙරට නායකයෝ එකඟ වී ඇත.

# මානව පරිණාමය පිළිබඳ නූතන ගවේෂණ

## 03 වන කොටස

**පසුගිය කලාපය හා සම්බන්ධයි.**




### කෙන්යන්ත්‍රොපස් (Kenyanthropus)

මීට පෙර ලිපි මගින් සාකච්ඡා කල ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ගේ මෙන්ම පැරැන්ත්‍රොපස් විශේෂයන්ගේ ශරීර ලක්ෂණ බොහෝ සෙයින් වානරයින්ට සමාන වුවද, ඊට සාපේක්ෂව වැඩි වශයෙන් මානව ශරීර ලක්ෂණ සහිත විශේෂයක් ලෙස කෙන්යන්ත්‍රොපස් විශේෂය හඳුනාගත හැක. වසර මිලියන 3කටත් පෙර විසූ මෙම විශේෂය සතුව පැතලි මුහුණක් සහ කුඩා දත් තිබීම ඊට නිදසුන් වේ. 1998 දී කෙන්යාවේ ටුරකානා ජලාශය ආශ්‍රිතව ප්‍රථම වරට මෙම විශේෂයට අයත් පොසිල සොයාගන්නා ලදී. එලෙස මෙම විශේෂයට අයත් පොසිල මුල්ම වරට කෙන්යාවෙන් හමුවීමත්, තවත් බොහෝ ආදි මානව විශේෂයන්ගේ පොසිල කෙන්යාවෙන් හමුවීමත් නිසා එය සනිටුහන් කිරීමට මෙම විශේෂය කෙන්යන්ත්‍රොපස් යනුවෙන් නම් කර ඇත.


මුල්ම වරට මෙම විශේෂයට අයත් පොසිල හමුවූ අවස්ථාවේදී එය ඔස්ත්‍රෙලෝපිතකස් වර්ගයකටම අයත් වන්නට ඇතැයි විද්‍යාඥයන් විශ්වාස කළද, සිදුකරන ලද පරීක්ෂණ හරහා එය එසේ නොවන බව තහවුරු විය. ඒ අනුව 2001 වසරේ පටන් මානව පරිණාමය අතරතුර නව විශේෂයක් ලෙස බිහිව පසුකාලීනව අභාවයට ගිය තවත් විශේෂයක් ලෙස කෙන්යන්ත්‍රොපස් සලකන ලදී. ඒ අනුව කෙන්යන්ත්‍රොපස් විශේෂයට අයත් උප විශේෂ ලෙස කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් සහ කෙන්යන්ත්‍රොපස් රුඩොල්ෆෙන්සිස් නම් කළද, පසුකාලීනව රුඩොල්ෆෙන්සිස් යනු තවත් හෝමෝ විශේෂයක් ලෙස හඳුනාගන්නා ලදී. ඒ අනුව කෙන්යන්ත්‍රොපස් විශේෂයට අයත් උප විශේෂ ලෙස මෙතෙක් හඳුනාගෙන ඇත්තේ, ප්ලැටියොපස් පමණි.




**ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස් කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් විසින් භාවිතා කළා යැයි සැලකෙන ගල් ආයුධ**

### කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් (Kenyanthropus platyops)

අදින් වසර මිලියන 3.5 - 3.2 අතර කාලයේදී ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස්, ඔස්ත්‍රෙලෝපිතකස් ඩෙයිරෙමේඩා, ඔස්ත්‍රෙලෝපිතකස් බහ්රෙල්ඝසාලි, ඔස්ත්‍රෙලෝපිතකස් අප්‍රිකානුස් යන විශේෂද මිහිමත විසූ කාලවලට සමගාමීව තවත් අසල්වැසියකු ලෙස කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් ජීවත්වන්නට ඇතැයි විශ්වාස කෙරේ. 1998දී සොයාගත්, පසුකාලීනව කෙන්යන්ත්‍රොපස් විශේෂයට අයත් ලෙස සලකනු ලැබූ KNM-WT 38350 නම් උඩ හනුවක පොසිලය අයත් වූයේ කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් උප විශේෂයටය. මෙම විශේෂයට වත්මන් මානවයාගේ මෙන් පැතලි මුහුණක් පැවැතීම නිසා ග්‍රීක් භාෂාවෙන් 'පැතලි' යන අදහස ගෙන දෙන 'ප්ලැටුස්' යන වචනයත්, 'මුහුණ' යන අදහස ගෙන දෙන 'ඔප්සිස්' යන වචනයත් එක්කර 'ප්ලැටියොපස්' යන නාමය නිර්මාණය කර ඇත. කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් පොසිල සොයාගන්නා තෙක් වත්මන් මිනිසාට සමාන ලෙස පැතලි මුහුණක් සහිත විශේෂයන් ලෙස විද්‍යාඥයන් විසින් හඳුනාගෙන තිබුණේ අදින් වසර මිලියන 2කට අඩු කාලයක් තුළ විසූ මානව විශේෂ පමණි.



**කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් හිස්කබලක්**



**කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් හිස්කබල ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද රුවක්**

කෙන්යන්ත්‍රොපස් ප්ලැටියොපස් මිහිමත සමස්ත කාලය පුරා ඔවුන් සමඟ සමගාමීව වාසය කළ ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස් හා සංසන්දනය කළ විට එකිනෙකට වෙනස් ආහාර රටාවන් පවතින්නට ඇතැයි විශ්වාස කෙරේ. ඇෆරන්සිස්ට සාපේක්ෂව ගත් විට ප්ලැටියොපස්ට කුඩා චාර්වක දත් පිහිටා තිබීම මීට ප්‍රධාන හේතුවයි. නමුත්, මෙම විශේෂ දෙකම සිය ප්‍රධාන ආහාරයක් වශයෙන් පැළෑටි සහ ශාක පත්‍ර අනුභව කරන්නට ඇත. ඔවුන් පරිසරයෙන් හමුවන ගල් සහ ලී දඬු ආයුධ ලෙස භාවිත කරන්නට ඇතැයි

07 පිටුවට

# ඔක්තෝබර් විප්ලවයේ සන්

**20 වැනි සියවසේ ලෝක දේශපාලනය තුළ සිදුවූ තීරණාත්මකම සිදුවීම කුමක් දැයි විමසා බැලූ විට එය අන් කිසිවක් නොව රුසියානු සමාජවාදී විප්ලවය නැතහොත්, 'ඔක්තෝබර් විප්ලවය' (නව දින දර්ශනයට අනුව නොවැම්බර් 07) බව අවිවාදිතය. අදින් වසර 106කට පෙර සිදුවූ මෙම සිදුවීම මඟින් ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයට සුවිශාල අත්දැකීම් ප්‍රමාණයක් එකතු කරනු ලැබීය. එය න්‍යායික, දේශපාලනික ක්‍රමවේදවල මෙන්ම බොල්ෂෙවික්වාදී සංවිධාන ක්‍රමවේදයේ උපතද සලකුණු කරනු ලැබීය. මෙම ලිපිය මඟින් කෙටියෙන් විමසා බැලෙන්නේ මෙම ගමන් මඟේ සුවිශේෂී සන්ධිස්ථාන මොනවාද යන්නයි.**

## 1. රුසියානු කම්කරු පන්ති ව්‍යාපාරයේ නැගීම

රුසියාවේ ධනවාදය වැඩෙන්නට පටන් ගනු ලැබූයේ 1860 පමණ වන විටය. 1866 පමණ වන විට රුසියාව තුළ කම්හල් 2,500-3,000ක පමණ කම්කරුවෝ ලක්ෂ හතක් පමණ වූහ. 1890 පමණ වන විට මෙය දෙගුණයකින් පමණ වර්ධනය විය. තවදුරටත් ඉඩම් අයිතිය ප්‍රභූ පන්තිය සතුව පැවැතිණි.

වර්නිෂෙව්ස්කි, බෙලින්ස්කි, හර්සන් ආදීන්ගේ පුරෝගාමීත්වයෙන් රුසියාවේ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ඇරැඹෙන්නේ 19 වැනි සියවසේ ආරම්භයේ සිටය. 1870 පමණ වන විට බකුනින්, ලැව්රෝව් ආදීන්ගේ නායකත්වයෙන් රුසියාවේ ගොවි විප්ලවවාදී ව්‍යාපාරයවූ 'නරෝද්නික්' ව්‍යාපාරය ආරම්භ විය. 1874දී එහි මුල්ම සංවිධානයවූ 'සිම්ලියා ඉ වොල්යා' පිහිටුවන ලදී. 1879දී එහි බෙදීමක් ඇතිවූ අතර, බහුතරය 'නරෝද්යා වොල්යා' නමින් දේශපාලන ත්‍රස්තවාදයේ මාවතට ප්‍රවේශ වූහ.

මුල් අවධිය තුළ රුසියාවේ කම්කරු පන්තිය වෙත නරෝද්නික් ව්‍යාපාරයේ බලපෑම තිබුණු අතර, 1875 වසරේදී රුසියාවේ පළමු කම්කරු සංවිධානයවූ **'දකුණු රුසියානු කම්කරු සංගමය'** ගොඩනගන ලදී. 1878දී ශාන්ත පීටර්ස්බර්ග්හි **'උතුරු රුසියානු කම්කරු සංගමය'** ගොඩනගන ලදී. 'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය', 'ප්‍රාග්ධනයේ' පළමු වෙළුම ඇතුළු මාක්ස්වාදයේ න්‍යායික කෘති මේ වන විට රුසියානු බසට පරිවර්තනය වෙමින් තිබිණි. ප්ලෙහානොව්, අක්සල්රොඩ්, වේරා සසුලිච්, ඉග්නාටොව් ආදීහු නරෝද්නික් ව්‍යාපාරයෙන් කැඩී මාක්ස්වාදය වෙත නැඹුරු වූහ. 1883 සැප්තැම්බරයේ ප්‍රථම රුසියානු මාක්ස්වාදී සංවිධානයවූ **'ශ්‍රම විමුක්ති කණ්ඩායම'** ජිනීවාහිදී පිහිටුවන ලදී.

ශාන්ත පීටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුව සිටි බ්ලැගායෙව්ගේ නායකත්වයෙන් **'රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය'** ගොඩනගන ලදී. මෙහි මඟපෙන්වීම මත අගනුවර අධ්‍යාපන කව 15ක් පමණ සංවිධානය කරනු ලැබීය. බ්ලැගායෙව් කණ්ඩායම විසින් රුසියාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පතවූ **'රොබෝචි'** ආරම්භ කරනු ලැබීය. 1885දී ට්‍රොට්ස්කිගේ නායකත්වයෙන් ශාන්ත පීටර්ස්බර්ග් කම්කරු සංගමයද බිහිවිය. පසුව මර්දනය හමුවේ එය බිඳී ගියේය.

## 2. ලෙනින්ගේ ආගමනය

1888දී ව්ලැදිමීර් ඉල්යිච් මුල් වරට කසාන් අධ්‍යාපන කවයට සහභාගී විය. 'සමාරා' අධ්‍යාපන කවය ගොඩනැගූ ඔහු ශාන්ත පීටර්ස්බර්ග් ඇතුළු අනෙකුත් කව සමඟ සම්බන්ධකම් ඇති කර ගත්තේය. ගැඹුරින් මාක්ස්වාදය හැදෑරූ ඔහු ශාන්ත පීටර්ස්බර්ග් අධ්‍යාපන කවයෙහි නායකත්වයට පත් විය. 1894දී **'ජනතාවගේ මිතුරා කවුරුන්ද, ඔවුන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන් කරන්නේ කෙසේද?'** යන ලිපිය මඟින් සහ 1899දී ලියූ **'රුසියාවේ ධනේශ්වර සංවර්ධනය'** නමැති කෘතිය මඟින් නරෝද්නික්වාදය තීරණාත්මක ලෙස පරාජය කරන ලදී. පසුව 1895දී **ශාන්ත පීටර්ස්බර්ග්හි 'කම්කරු පන්ති විමුක්ති අරගල සංගමය'** ගොඩනගනු ලැබීය. 1896දී පීටර්ස්බර්ග් වැඩ වර්ජනයට මෙම සංවිධානය නායකත්වය ලබා දෙමින් ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කරනු ලැබීය. මෙම වකවානුව තුළ ලෙනින් ඇතුළු 40 දෙනකු අත්අඩංගුවට ගෙන සයිබීරියාවට පිටුවහල් කරන ලදී. පිටුවහලේ සිටි ලෙනින්ගේ



මඟපෙන්වීමෙන් 1898 මාර්තු 01 - 03 යන දිනවලදී මියුනික්හිදී රුසියාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රථම සමුළුව පවත්වනු ලැබීය.

## 3. පක්ෂයේ දෙවැනි සමුළුව සහ අවස්ථාවාදයට එරෙහි අරගලය


### 3.1. මතවාදී අරගලය

1900දී පිටුවහලේ සිට පැමිණි ලෙනින්ගේ නායකත්වයෙන් 'ඉස්ක්‍රා' (ගිනිපුපුර) පුවත්පත අරඹනු ලැබීය. මෙම පුවත්පත මඟින් ප්‍රචාරකයකු, උද්ඝෝෂකයකු සහ සංවිධායකයකු ලෙස කම්කරු පන්තියට මඟපෙන්වනු ලැබීය.

### 3.2. ආර්ථිකවාදයට සහ සාංසිද්ධිකවාදයට එරෙහි අරගලය

'ආර්ථිකවාදය' 1890 වකවානුවේ සිටම රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ මතුවූ අවස්ථාවාදී ප්‍රවණතාවකි. **'ආර්ථික අරගලය කම්කරුවන්ට සහ දේශපාලනය ලිබරල්වාදීන්ට'** යන සටන් පාඨය මගින් කම්කරු පන්තියේ අරගලය ආර්ථික ඉල්ලීම්වලට පමණක් සීමා කිරීම සහ නිර්ධන පන්තියට ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍ය බවට

# ධිස්ථාන



ප්‍රකාශ කිරීම කරනු ලැබිණි.

පන්ති විඥානය, කම්කරු අරගල, සමාජවාදය නිදහස්ව කම්කරු පන්තිය අතරින් වැඩෙන බවත්, එම නිසා පිටතින් කම්කරු පන්ති ව්‍යාපාරය සංවිධානය කිරීම අනවශ්‍ය බවත් සාංසිද්ධිකවාදීන් විසින් මතයක් ගොඩනගන ලදී. මෙම අවස්ථාවාදී මතවලට එරෙහිව '**ඉස්ක්‍රාව**' මඟින් තීරණාත්මක වැඩ කොටසක් ඉටු කරන ලදී.

### 3.3. මෙන්ෂෙවික් - බොල්ෂෙවික් ලෙස බෙදී යාම

රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ දෙවැනි සමුළුව 1903 ජූලි 17 වැනි දින සිට අගෝස්තු මස 10 වැනි දින දක්වා බ්‍රසල්ස් සහ ලන්ඩන් නගරවල පැවැත්විණි.

පක්ෂයේ අවම වැඩපිළිවෙළ වශයෙන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී නිර්ධන පන්තියේ හදිසි කාර්යභාරය මෙන්ම උපරිම වැඩපිළිවෙළ වශයෙන් නිර්ධන පන්ති රාජ්‍ය බලය ස්ථාපනය කිරීමද සාකච්ඡා කෙරිණි.

පක්ෂ සංවිධාන මූලධර්ම පිළිබඳ විවාදයක් මතුවූ අතර, ලෙනින් ඇතුළු නිවැරදි මතය නියෝජනය කළ 'ඉස්ක්‍රා' කණ්ඩායම 'බොල්ෂෙවික්' ලෙසද, මාටොව් ප්‍රමුඛ සුළුතරය මෙන්ෂෙවික් ලෙසද හඳුන්වනු ලැබීය. සමුළුව තුළ බොල්ෂෙවික් මතවාදය ජයග්‍රහණය කරනු ලැබුවද, අවස්ථාවාදී මෙන්ෂෙවික් කණ්ඩායම විසින් එතැන් පටන් පක්ෂයට එරෙහිව කටයුතු කරනු ලැබීය. බොල්ෂෙවික්වාදය හැදී, වැඩී, සංවර්ධනය වන්නේ මෙම විශේෂ තත්ත්වය තුළය.

## 4. ප්‍රථම රුසියානු විප්ලවය (මොස්කව් නැගිටීම)

මෙම නැගිටීම සඳහා ආසන්න හේතුව වූයේ 'ලේ ගැලූ ඉරිදා' සිදුවීමයි. පෙට්‍රොග්‍රෑඩයේ ගැපෝන් නම් පූජකයකු යටතේ ප්‍රතිවිප්ලවීය වෘත්තීය සමිතියක් ගොඩනගනු ලැබ තිබිණි. එහි බලපෑම යටතේ 1905 ජනවාරි 09 වැනිදා කම්කරුවන් එක්ලක්ෂ හතළිස්දහසක සාමකාමී පෙළපාළියක් සාර් මාලිගයට පිටත් විය. සාර්ගේ නියෝගය මත එයට වෙඩි තබන ලදී. මෙම සිදුවීම කේන්ද්‍ර කර ගනිමින්, කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ නැඟිටීමක් ඇති විණි. බොල්ෂෙවික් පක්ෂය විසින් ඊට නායකත්වය දෙනු ලැබීය. පක්ෂයේ තුන්වැනි සමුළුව 1905 අප්‍රේල් මස 22 වැනි දින සිට 27 වැනි දින දක්වා ලන්ඩනයේ පැවැත්වුණද, මෙන්ෂෙවිකයෝ ඊට සහභාගී නොවූහ. එම සමුළු තීරණ ගොනු කරමින්, 'ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙක' යන කෘතිය ලෙනින් විසින් ලියන ලදී. පක්ෂයේ අවම වැඩපිළිවෙළ ලෙස '**කම්කරුවන්ගේ, ගොවීන්ගේ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයක් ගොඩනැගීම**' විප්ලවයේ අරමුණ විය. විප්ලවය පරාජයට පත්විය.

- ✧ විප්ලවයේ පරාජයත් සමඟ මර්දනය උත්සන්න විය. ජනතාව රැවටීමට ඩූමා මැතිවරණය සූදානම් කරන ලදී. පළමුවැනි ඩූමා මැතිවරණය බොල්ෂෙවිකයන් විසින් වර්ජනය කරන ලද අතර, මෙන්ෂෙවිකයෝ ඊට සහභාගී වූහ. 1906 ජූලියේදී සාර් විසින් ප්‍රථම ඩූමාව විසුරුවාහරින ලදී. දෙවැනි ඩූමාවද බොල්ෂෙවිකයෝ වර්ජනය කළහ. තුන්වැනි ඩූමාවට බොල්ෂෙවිකයෝ ගොවීන් සමඟ එක්ව තරඟ කළහ.

### 4.1. විප්ලවය අසාර්ථක වීම සහ පශ්චාත් සිදුවීම්

මර්දනයත් සමඟ පක්ෂය විශාල පසුබෑමකට ලක් විය. පක්ෂය නීති විරෝධී ක්‍රියා සම්පූර්ණයෙන් අතහැර කටයුතු කළ යුතුය යන මතය නියෝජනය කළ පිරිස 'ලික්විඩේටර්වාදීන්' ලෙසත්, නීති විරෝධී ක්‍රියාමාර්ග පමණක් යුතුය යන ස්ථාවරයේ සිටි පිරිස ඔත්සොව්වාදීන් ලෙසත් ප්‍රවණතා දෙකක් මතු විය. මෙම ප්‍රවණතා දෙකම ප්‍රතික්ෂේප කළ ලෙනින් අවස්ථාව අනුව තත්ත්වයන් අනුව මෙම ක්‍රියාමාර්ග දෙකම එකට අනුගමනය කිරීම අවධාරණය කළේය.

## 5. මෙන්ෂෙවික්වරුන් පක්ෂයෙන් නෙරපාහැරීම

### 5.1. 1912 ලේනා කම්කරු නැඟිටීම

1912 අප්‍රේල් මස 04 වැනි දින සයිබීරියාවේ ලේනා රන් ආකර කම්කරුවන්ගේ වර්ජනයේදී ඊට වෙඩි තැබීම පදනම් කර ගනිමින්, වර්ජන රැල්ලක් ක්‍රියාත්මක විය. 1905න් පසු කම්කරු නැඟිටීම් වර්ධනයවූයේ මේ සමඟයි.

### 5.2. 1912 රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ 6 වැනි සමුළුව

1912 ජනවාරියේදී චෙකොස්ලොවැකියාවේ ප්‍රාග් නුවරදී පැවැත්වූ මෙම සාකච්ඡා සභාවට ප්‍රාදේශීය පක්ෂ සංවිධාන 20ක පමණ නියෝජිතයෝ සහභාගී වූහ.

මෙහිදී:

- ✧ කම්කරු පක්ෂය නැවත පිහිටුවීම.
- ✧ ලික්විඩේටර්වරුන් ඇතුළු අවස්ථාවාදීන් පක්ෂයෙන් නෙරපාහැරීම.
- ✧ නව මධ්‍යම කාරක සභාවක් පත් කර ගැනීම ආදිය සිදුවිය.

### 5.3. අගෝස්තු හවුල

පක්ෂයෙන් නෙරපාහැරුණු මෙන්ෂෙවිකයන් (ලික්විඩේටර්වරුන් ඇතුළු කොටස්) විසින් ට්‍රොට්ස්කිගේ නායකත්වයෙන් 'අගෝස්තු හවුල' පිහිටුවා ගනු ලැබුවද, කෙටි කලකින් එය අභාවයට පත්විය.

## 6. 1917 ධනේශ්වර විප්ලවය සහ තාවකාලික ආණ්ඩුව

- ✧ 1917 පෙබරවාරි මාසයේදී වැඩවසම් සාර් පාලනය පලවාහැර තාවකාලික ආණ්ඩුවක් පිහිටුවීය. මෙමගින් රුසියාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සංකේතවත් විය.

### ✧ ද්විත්ව බලය

තාවකාලික ධනපති ආණ්ඩුවේ බලයට සමාන්තරව පෙට්‍රොග්‍රෑඩය ඇතුළු අනෙකුත් ප්‍රදේශවල කම්කරු, ගොවි සහ සෙබළ 07 පිටුවට




# ෆිදෙල්ගේ වියට්නාම් සංචාරයේ 50වැනි සංවත්සරය සැමරේ



කියුබානු විප්ලවීය නායක ෆිදෙල් කස්ත්‍රෝගේ ඓතිහාසික වියට්නාම් සංචාරයේ 50වැනි සංවත්සරය වෙනුවෙන් පැවති උත්සවයක් පසුගිය 12 වැනිදා කියුබාවේ හවානාහි දී පැවැත්විණි. ඒ කියුබානු ජනාධිපති මිගුවෙල් ඩයස් කානෙල්ගේ සහභාගිත්වයෙනි. මේ සඳහා වියට්නාම් තානාපතිවරයා, කියුබානු පාර්ලිමේන්තුවේ සභාපතිවරයා, කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ සංවිධාන ලේකම්වරයා සහ කියුබානු විදේශ අමාත්‍යවරයා එක්ව සිටියහ.

මෙම වියට්නාම් සංචාරයේ විශේෂත්වය වූයේ 1973 වියට්නාම් යුද්ධය අතරතුර දකුණු වියට්නාමයේ සංචාරය කළ පළමු සහ එකම ලෝක නායකයා ෆිදෙල් කස්ත්‍රෝ වීම ය. මෙම සංචාරයේ දී ෆිදෙල් දකුණු වියට්නාමයේ ඒ වන විට නිදහස් කර ගෙන තිබූ ප්‍රදේශවලට ගිය අතර, ප්‍රාදේශීය විප්ලවීය ආණ්ඩුවේ සාමාජිකයන් සහ දකුණු වියට්නාමය නිදහස් කර ගැනීම සඳහා වූ ජාතික පෙරමුණේ සටන්කාමීන් හමු වී තිබිණි.

මෙම සංචාරය වියට්නාමය එක්සත් කිරීමේ නිදහස් අරගලයට මහත් ශක්තියක් එක් කළ අතර, වර්තමානයේ එම සිදුවීම දෙරට අතර මිත්‍රත්වයේ ද, සහයෝගීතාවයේ ද සංකේතයක් ලෙස සමරනු ලබයි.

# ගුවාතමාලා වාමාංශික ජනාධිපතිගේ ජය ආපසු හරවන තැතක්

පසුගිය අගෝස්තු විසි වන දින පැවැති ගුවාතමාලා ජනාධිපතිවරණයේ දෙවන වටයේ දී අධිරාජ්‍ය විරෝධී වාමාංශික අපේක්ෂක බර්නාඩෝ එරවෙලෝ ලියෝන් (Bernardo Arévalo de León) විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර තිබිණි. ඒ, 60.9%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමිනි. සමාජවිද්‍යාඥයකු සහ දේශපාලනඥයකු වන ඔහු මධ්‍ය වාමාංශික අදහස් දරන්නකු ලෙස සැලැකේ. හිටපු ජනාධිපතිවරයකුගේ බිරිඳ වූ ඔහුගේ ප්‍රතිවාදී දක්ෂිණාංශික අපේක්ෂිකා සැන්ඩ්‍රා ටොරෙස්ට ලබාගත හැකි වූයේ 39.1%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි. 1954 වසරේ දී එක්සත් ජනපදයේ අනුග්‍රහය ලත් කුමන්ත්‍රණයෙන් නෙරපා හරින ලද ජාකොබ් ආබෙන්ස්ගෙන් පසු ගුවාතමාලාවේ මැතිවරණයකින් ජය ලබා පත්වූ වඩාත්ම ප්‍රගතිශීලී නායකයා ඔහු ලෙස සැලැකේ.

දූෂණයට එරෙහි දැඩි මැතිවරණ ව්‍යාපාරයකින් පසු ජනාධිපති ලෙස තේරී පත්වූ එරවෙලෝ 2024 වසරේ ජනවාරි 14 වැනි දින දිවුරුම් දීමට නියමිත වූ නමුදු, ඔහුගේ ජයග්‍රහණ ආපසු හැරවීමේ කුමන්ත්‍රණයක් සිදු වෙමින් ඇති බව ද වාර්තා වේ. මේ තත්ත්වය තුළ තමන්ට සහාය දක්වමින් වීදි බසින ලෙසට එරවෙලෝ ජනතාවගෙන් ඉල්ලා සිටියේ ය. ඒ අනුව පසුගිය සැප්තැම්බර් 18වැනි දින ජනතාව දහස් ගණනින් ගුවාතමාලා සිටි අගනුවරට රැස්වූයේ, කුමන්ත්‍රණ උත්සාහයට එරෙහිව එරවෙලෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නෛතික පියවර ගනිමින් සිටින අතරතුර ය.

පෙරදී දූෂණ චෝදනා ලබා සිටි ගුවාතමාලාවේ නීතිපතිවරිය (María Consuelo Porras) දෙවන වටයේ මැතිවරණයට පෙර එරවෙලෝගේ නාමයෝජනාව ඉවත් කිරීම සඳහා පවා උත්සාහ කර තිබූ අතර, උත්තරීතර මැතිවරණ විනිශ්චය සභාව විසින් එය ව්‍යර්ථ කර තිබිණි. කෙසේ වුව ද, ඇය තම උත්සාහය අත්හැර නොමැති අතර, එහි භයානකම පියවර වූයේ ඇයගේ නියෝග පරිදි පොලිසිය විසින් පැවැති මැතිවරණයට අදාළ ඡන්ද පෙට්ටි විවෘත කිරීම ය. එසේම එරවෙලෝගේ පක්ෂය වන 'සීඩ්' ව්‍යාපාරයේ (Seed Movement) ප්‍රධාන කාර්යාලය ද, මැතිවරණ විනිශ්චය සභාව ද පොලිස් පරීක්ෂාවට ලක්කිරීමට ඇය විසින් කටයුතු කර තිබේ. අධිකරණ නියෝගයකින් තොරව ඡන්ද පෙට්ටි විවෘත කිරීම ද, මැතිවරණ විනිශ්චය සභාව පරීක්ෂා කිරීම ද නීති විරෝධී බව ප්‍රකාශ වී ඇත.

මැතිවරණයේ දී වංචා සිදුවී ඇති බව පවසමින් නීතිපතිවරිය තමන්ගේ ක්‍රියාවන් සාධාරණීයකරණය කර ගැනීමට උත්සාහ දරනු ලැබුව ද, ගුවාතමාලා මැතිවරණය ආවරණය කළ දකුණු ඇමෙරිකානු රටවල ස්වාධීන නිරීක්ෂකයන් පවසන්නේ මහා පරිමාණ අක්‍රමිකතා පිළිබඳ කිසිදු සාක්ෂියක් නොමැති බව ය.

# බටහිර හිතවාදී ආණ්ඩුවට එරෙහිව චෙක් ජාතිකයෝ වීදි බසිති

පසුගිය 16වැනි දින චෙක් ජාතිකයෝ දහස් ගණනින් ප්‍රාග් අගනුවර වෙන්සෙස්ලාස් චතුරස්‍රයට රැස්වී ආණ්ඩුවට සිය විරෝධය පළ කළහ. ඒ ඉහළ යන උද්ධමනය, බදු සහ විශ්‍රාම වැටුප් සංශෝධනවලට එරෙහිව ය. එහි දී ප්‍රදර්ශනය කෙරුණු බැනර් සටන්පාඨවල "එ.ජ. හිතවාදීන් හංගවේවා!", "නේටෝව හංගවේවා!" යන අදහස් අඩංගු වී තිබිණි.

මෙහි දී පැවැති විරෝධතා රැලිය සඳහා ලක්ෂයකට වැඩි පිරිසක් එක්ව සිටි අතර, ඉන් අනතුරුව එයින් කොටසක් චතුරස්‍රයේ සිට චෙක් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය ඉදිරිපිටට පෙළපාළියකින් ගමන් කළහ. යුක්‍රේන යුද්ධය සමඟ යුරෝපය දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින අතර, චෙක් ජනරජය ද එයින් පීඩා විඳිමින් තිබේ. මහජන මත පර්යේෂණ මධ්‍යස්ථානය විසින් කරන ලද මත විමසුමකට අනුව චෙක් ජනතාවගෙන් බහුතරයක් සිටින්නේ රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ අප්‍රසාදයෙනි. සියයට 57ක් ආර්ථික තත්ත්වය අයහපත් බවට පිළිගන්නා අතර, තවත් සියයට 25ක් හොඳක් හෝ නරකක් නැති බව ද ප්‍රකාශ කර තිබිණි. කෙසේ වුව ද, ආර්ථිකය යහපත් බවට පිළිගෙන තිබුණේ සියයට 16කි. වසරේ දෙවැනි කාර්තුවේ දළ ජාතික නිෂ්පාදිතය සියයට 0.6කින් පහත ගොස් තිබූ අතර, අගෝස්තු මාසයේ දී පාරිභෝගික භාණ්ඩ මිල සියයට 8.5කින් ඉහළ ගොස් තිබිණි.

# බ්‍රසීලය සහ වෙනිසියුලාව නැවතත් විදුලියෙන් බැඳෙයි

වෙනිසියුලාවේ ජලවිදුලි බලාගාරවල නිෂ්පාදනය කරන විදුලිය බ්‍රසීලයේ උතුරුදිග ප්‍රදේශවලට ලබා ගැනීමේ වැඩසටහන නැවත ඇරඹීමට දෙරට විසින් තීරණය කර තිබේ. මේ බව අනාවරණය කරන්නේ එක්සත් ජාතීන්ගේ සමුළුව වෙනුවෙන් නිව්යෝර්ක් නුවරට පැමිණ සිටින බ්‍රසීලයේ පතල් සහ බලශක්ති අමාත්‍ය ඇලෙක්සැන්ඩර් සිල්වේරියා විසිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ බ්‍රසීලයේ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ වී නොමැති උතුරුදිග රොරයිමා ප්‍රාන්තයේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට අපේක්ෂා කෙරිණි. කෙසේ 07 පිටුවට

## ඔක්තෝබර් විප්ලවයේ සන්ධිස්ථාන .......

04-05 - පිටුවෙන්

නියෝජිත සෝවියට් සභා තුළද ජනතා බලය ඒකරාශීවී තිබිණි. ලෙනින් මෙය 'ද්විත්ව බලයක්' ලෙස හැඳින්වීය. 1917 අප්‍රේල් මස ලෙනින් ස්විට්සර්ලන්තයේ සිට රුසියාවට පැමිණ පක්ෂ සමුළුව කැඳවනු ලැබීය.

එහිදී:

- **සියලු බලය සෝවියට් සභාවලට පවරා ගැනීම.**
- **විප්ලවයේ වත්මන් අවධිය 'සමාජවාදය' ලෙස නම් කිරීම.**
- **ඊට අනුරූපව පක්ෂයේ නම 'කොමියුනිස්ට් පක්ෂය' ලෙස නම් කිරීම.**
- **අවස්ථාවාදී දෙවැනි ජාත්‍යන්තරය වෙනුවට තුන්වැනි ජාත්‍යන්තරක් ගොඩනැගීම පිළිබඳ තීරණ ආදිය ගනු ලැබිණි. මෙම සමුළුව ඔක්තෝබර් විප්ලවයේ සුවිශේෂී හැරවුම් ලක්ෂ්‍යයක් විය.**

### 7. 1917 ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණය

#### 7.1. 1917 ජුනි මස 03-04 පහර දීමේ යෝජනාව

මතුවී ඇති ද්විත්ව බලයත්, අරාජික ස්වභාවයත් හමුවේ බලය අල්ලා ගැනීම සඳහා පහර දීමේ යෝජනාවක් මතුවූ අතර, එය ලෙනින් විසින් පරාජය කරන ලදී.

"කැරැල්ලක් සාර්ථකවීම සඳහා එය කුමන්ත්‍රණය මත නොව පක්ෂය මත නොව වඩාත් දියුණු පන්තිය මත පදනම් විය යුතුය. ප්‍රථම කරුණ මෙයයි. ජනතාවගේ විප්ලවවාදී උත්සන්නියක් මත විශ්වාසය තැබිය යුතුය. දෙවැනි කාරණය එයයි. කැරැල්ල ජනතාවගේ දියුණුතම පිරිස්වල ක්‍රියාකාරීත්වය උපරිම මට්ටමෙහි පවතින සතුරු පිරිස් සහ විප්ලවයේ දුර්වල, එක්සිත් නැති හා අධිෂ්ඨාන විරහිත මිතුරු පිරිස් අතර වැනෙනසුලුභාවය ඉතාමත් බලවත් අවස්ථාව වන වර්ධනය වන විප්ලවයේ ඉතිහාසයේ සන්ධිස්ථානය කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. තුන්වැනි කරුණ එයයි. කැරැලි ගැසීම පිළිබඳ ප්‍රශ්නය මතු කිරීමට අදාළව මෙම කොන්දේසි තුන සැලැකිල්ලට ගැනීමෙන් මාක්ස්වාදය හා බ්ලැන්කිවාදය අතර වෙනස පෙනී යන්නේය.

"එසේ වුවද, මෙම කොන්දේසි ඉටුවී පවතින කල කැරැලි ගසා නැගීසිටීම කලාවක්සේ නොසැලැකීම මාක්ස්වාදය පාවාදීමක්, විප්ලවය පාවා දීමක් වන්නේය."

ලෙනින්, 6 වැනි වෙළුම, 133-134 පිටු

#### 7.2. කර්නිලව් කැරැල්ල සහ විප්ලවය

1917 අගෝස්තුවේදී දියත්වූ මෙම කැරැල්ලේ නායකත්වය ගනු ලැබුවේ සාර් හමුදාවේ සේනාධිනායකයාවූ කර්නිලව්ය. එහි අරමුණ වූයේ තාවකාලික ආණ්ඩුව පලවාහැර යළි රාජාණ්ඩුව ස්ථාපනය කිරීමයි. මතුවී ඇති නව තත්ත්වය තුළ ක්‍රියාත්මකවූ බොල්ෂෙවික් පක්ෂය ලෙනින්ගේ මඟපෙන්වීම මත මෙම ප්‍රතිගාමී කැරැල්ල මර්දනය කිරීම සඳහාත්, තාවකාලික ආණ්ඩුව පලවාහැර නිර්ධන පන්ති රාජ්‍ය බලය ස්ථාපනය කිරීම සඳහාත් කම්කරු පන්තිය මෙහෙයැවීය. 1917 ඔක්තෝබර් 10 වැනි දින රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව අවිගත් නැගිටීමක් සම්මත කර ගත්තේය. ඔක්තෝබර් 25 වැනි දින තාවකාලික ආණ්ඩුව බිඳදමා යුද විප්ලවවාදී කමිටුවට බලය පවරා ගැනීමත් සමඟ සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කරනු ලැබීය.

## මානව පරිණාමය පිළිබඳ .......

03 - පිටුවෙන්

විශ්වාස කළද, මුවහත් කරන ලද ගල් ආයුධ භාවිත කළ බවට සාක්ෂි හමුව නැත. කාන්තා - පිරිමි, ළමා - වැඩිහිටි මිශ්‍ර සමාජයක් ලෙස ප්ලැට්යොපස් ජීවත්වන්නට ඇතැයිද විශ්වාසයක් පවතී. තණ බිම් මෙන්ම වනාන්තර ආශ්‍රිතවද ඔවුහු වාසය කර ඇත.

පොසිල සාක්ෂි සීමිත වීම නිසා ප්ලැට්යොපස්ගේ ශරීර ස්වභාවය ගැන තවත් අනාවරණය කරගැනීමට බොහෝ දේ ඇතත්, දැනට දන්නා කරුණු අනුව ඔවුන් දෙපයින් ගමන් කිරීම සිදු කළ විශේෂයක් වේ. එමෙන්ම ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස් හා සමානවම ප්ලැට්යොපස්ගේ කපාල ධාරිතාවද ඝන සෙන්ටිමීටර් 430ක් පමණ වේ. ඝන එනමලයකින් සමන්විත දත් ඔවුනට තිබී ඇත.

කෙන්යන්ත්‍රොපස් ප්ලැට්යොපස් පරිණාමය වූයේ කවර විශේෂය හරහාද යන්න තහවුරු කළ හැකි සාක්ෂි මෙතෙක් සොයාගෙන නොමැත. බොහෝ විද්‍යාඥයන් විශ්වාස කරන්නේ ඔස්ත්‍රෙලෝපිතකස් ඇෆරන්සිස් හරහා ඔවුන් පරිණාමය වන්නට ඇති බවයි. දේහ ලක්ෂණ අනුව ඊට වසර මිලියනයකට පමණ පසු ජීවත්වූ හෝමෝ රුඩොල්ෆෙන්සිස් සමඟ බොහෝ සමානකම් පවතින හෙයින් ඔවුන් පරිණාමය වන්නට ඇත්තේ කෙන්යන්ත්‍රොපස් ප්ලැට්යොපස් හරහා යැයි මතයක් පවතී. එසේම මෙම විශේෂ දෙකම වත්මන් මානවයාගේ දේහ ලක්ෂණ අනුව බොහෝ සේ සමානවීම නිසා වත්මන් මානවයාගේ පරිණාමය සිදුවූයේ මෙම විශේෂයන් දෙවර්ගය හරහා යැයිද සමහර විද්‍යාඥයෝ මත පළ කර ඇත. එහෙත්, එම පෙළෙහි අතර මැද පියවරවල් සම්පූර්ණ කරන සාක්ෂි මෙතෙක් හමුවී නොමැති අතර, එසේ හමුවුවහොත්, මෙතෙක් බොහෝ විද්‍යාඥයන් විසින් විශ්වාස කරනු ලබන ආකාරයට මානව වර්ගයා බිහිවූයේ ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂ හරහාය යන මතය ඉවත දැමීමට සිදුවනු ඇත.

**තවත් කොටසක් ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වන්න**

## බ්‍රසීලය සහ වෙනිසියුලාව .......

06 - පිටුවෙන්

වුවද, බ්‍රසීලයේ හිටපු දක්ෂිණාංශික ජනාධිපති බොල්සෙනාරෝ 2019දී වෙනිසියුලාවෙන් විදුලිය ලබා ගැනීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට පියවර ගත්තේය. ඒ එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදී රටවල් වෙනිසියුලාවට එරෙහිව පනවා ඇති සම්බාධකවලට අනුගත වෙමිනි.

පසුගිය ජනවාරි 01වැනි දින ලූලා ද සිල්වා බ්‍රසීලයේ ජනාධිපති ධුරයේ වැඩ ඇරඹීමත් සමඟ ලතින් ඇමෙරිකාවේ වාමවාදී රටවල් සමඟ සබඳතා නැවතත් වර්ධනය කර ගැනීම ඇරැඹිණි. ඒ අනුව පසුගිය මැයි මාසයේදී බ්‍රසීලයේ ලූලා ද සිල්වා සහ වෙනිසියුලාවේ නිකොලාස් මදුරෝ ජනාධිපතිවරු දෙදෙනා විසින් දෙරට අතර විදුලි පද්ධතිය නැවත සම්බන්ධ කිරීමේ ගිවිසුමකට අත්සන් තබා තිබිණි. වසර 04කට වැඩි කාලයක් එම විදුලි පද්ධතිය නඩත්තු නොකිරීම හේතුවෙන් විදුලිබල සම්ප්‍රේෂණය යථාවත් කිරීමට අවම වශයෙන් ඩො.මි. 04ක මුදලක් වැය වනු ඇතැයි පැවසේ.

# මුදලේ ගමන් මඟ

මුදල යන්නට යොදන ඉංග්‍රීසි යෙදුම වන Money යන වචනය පැමිණ ඇත්තේ, ලතින් භාෂාවේ කාසි යන අදහස සහිත Moneta යන වචනයෙනි. මුදල සැමදාම නොපැවැතුණු බවත්, මුදල බිහිවීමට පෙර භාණ්ඩ හුවමාරුව පැවැති බවත් පොදු පිළිගැනීමයි. ක්‍රිස්තු පූර්ව 8 වන සියවසේ චීනයේද, ක්‍රිස්තු පූර්ව හත්වන සියවසේ සුළු ආසියාවේද (වත්මන් තුර්කිය පිහිටි ප්‍රදේශය) නිල කාසි භාවිතය ආරම්භවී තිබේ. මුලින්ම කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍ර භාවිත කළ චීනය තුළ ක්‍රිස්තු වර්ෂ වර්ෂ 1260දී මුල්වරට මුදල් නෝට්ටු භාවිතය ආරම්භවී තිබේ. ඉන් අනතුරුව ලොවපුරා මුදල් නෝට්ටු භාවිතය ව්‍යාප්තවී තිබේ.

මුදල පිළිබඳව නිශ්චිත එක් ධනේශ්වර මතයක් නැති අතර, මුදලේ සම්භවය පිළිබඳ ප්‍රධාන මත තුනක් පවතී.

1. මුදල පිළිබඳ නාමික වාදී මතය.
2. මුදල් පිළිබඳ ලෝහමය මතය.
3. මුදල පිළිබඳ ප්‍රමාණාත්මක මතය.

**මුදලේ සම්භවය**

මුදල සැමදා නොපැවැති බව පොදු පිළිග ැනීම වන අතර, මුදල අවශ්‍ය වූයේ භාණ්ඩ හුවමාරුව සඳහා ය. ප්‍රාථමික සාමූහික සමාජය තුළදී ගෝත්‍රය සඳහා අවශ්‍ය දේ එහිම නිපදවා ගත් බැවින්, භාණ්ඩ හුවමාරුවක් සිදු නොවිණි. සමාජමය ශ්‍රම විභජනයත්, පසුව සිදුවූ පෞද්ගලික දේපළ අයිතියත් නිසා භාණ්ඩ හුවමාරුව අවශ්‍ය දෙයක් බවට පත්විය. අහඹු හුවමාරුවෙන් ආරම්භවී භාණ්ඩ - භාණ්ඩ හුවමාරුව කරළිගත විය. අවශ්‍යතා සංකීර්ණ වීමත් සමඟ මෙය අර්බුදයට ගිය අතර, හුවමාරු කරගත හැකි පොදු භාණ්ඩයක වුවමනාව මතුවිය. එසේ මුලින්ම යොදා ගත් පොදු භාණ්ඩය බවට පත් වූයේ ගවයන්ය. මීට අමතරව බැටළුවන්, සිප්පිකටු ආදියද යොදා ගන්නා ලදී. හුවමාරුව සංකීර්ණවීම නිසාම උක්ත පොදු භාණ්ඩ භාවිත කිරීම දුෂ්කරවූ අතර, පසුව මේ සඳහා වටිනා ලෝහ යොදා ගැනිණි. මුලින් ලෝහ කැබලි යොදා ගත් අතර, පසුව කාසි දක්වා එය වර්ධනය විය. රාජ්‍ය මැදිහත්වීම සිදුවන්නේ මේ සමඟ වන අතර, කාසියේ එක් පැත්තකට රජුගේ රුව යොදා ගැනිණි. මෙසේ නිල කාසි එළිදැක්වීමේ ක්‍රියාවලිය 'ටංකනය' ලෙස හඳුන්වා තිබේ.



මුදල බිහිවීමට පෙර භාණ්ඩවලට මිලක් නොතිබිණි. මිල යනු මුදල් මඟින් ප්‍රකාශ වන හුවමාරු භාණ්ඩයක වටිනාකමයි.

**මාක්ස්වාදී අර්ථදැක්වීම**

"වටිනාකම් ආකාරයන්ගේ සහ හුවමාරුවේ ස්වයංසිද්ධ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස පැනනඟින හුවමාරු භාණ්ඩ හුවමාරුවේදී විශ්වීය සමකය ලෙස ක්‍රියා කරන විශේෂ වර්ගයක හුවමාරු භාණ්ඩයකි."

('දේශපාලන ආර්ථික විද්‍යා ශබ්දකෝෂය', ප්‍රගති ප්‍රකාශන, මොස්කව්.)

ධනේශ්වර දේශපාලන විද්‍යාව මුදලේ සම්භවය හා හරය පිළිබඳ ගැටලුව විසඳීමට අසමත් විය. එය විද්‍යාත්මකව විසඳන ලද්දේ කාල් මාක්ස් විසිනි.

"ධනේශ්වර ආර්ථික විද්‍යාඥයන් කිසිදිනක උත්සාහ නොකළ කාර්යභාරයක් අප වෙත තබා ඇත. එනම්, හුවමාරු භාණ්ඩ වටිනාකම තුළ ගම්‍ය වන වටිනාකම් ප්‍රකාශනයේ සංවර්ධනය එහි සරලතම, නොපෙනෙන තරම් දළ සටහනක සිට විස්මයජනක මුදල් ආකාරය දක්වා මෙකී මුදල් ආකාරයේ සම්භවය සොයා ගැනීමේ කාර්යභාරයයි. මෙය ඉටු කිරීමෙන් අපට මුදල් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රහේලිකාව විසඳිය හැකිය."


( කාල් මාක්ස්, ප්‍රාග්ධනය වෙළුම 1)

මුදලෙහි ප්‍රධාන කාර්යභාරයන්

1. වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියාකිරීම.
2. සංසරණ මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීම.
3. වටිනාකම් රැස්කිරීමෙන් මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීම.
4. ගෙවීම් මාධ්‍යයක් ලෙස ක්‍රියාකිරීම.
5. ජාත්‍යන්තර මුදල් ලෙස ක්‍රියාකිරීම.

**මුදලේ අනාගතය**

මුදල සම්භවය වන්නේ භාණ්ඩ හුවමාරුවේදී අතරමැදි කාර්යය ඉටුකරන විශ්වීය සමකය ලෙසටය. හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය නොවන තත්ත්වයක් යටතේදී මුදලෙහි පැවැත්මක් අවශ්‍ය නොවේ. හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය වෙනුවට පරිභෝජනය ඉලක්ක කර ගනිමින්, පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය වන සමාජයකදී (කොමියුනිස්ට් සමාජයේදී) මුදලේ අවශ්‍යතාව නැතිව යයි. වටිනාකම නමැති ආර්ථික වර්ගයද මුදල සමඟම අතුරුදන්වේ. මුදල් වෙනුවට මුදල් ආදේශක ලෙස කාඩ්පත් හර කාඩ්පත් මෙන්ම ක්‍රිප්ටෝ මුදල් (Crypto Currency) ආදිය හේතුවෙන් මුදල අහෝසි නොවේ. මුදල අහෝසි වන්නේ හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය නැවැතී එය පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය බවට පත්වූ දිනකදී මුදලෙහි අවශ්‍යතාව නැතිව ගිය විටදීය.



**"දෙවැනි මහා ශ්‍රම විභජනය ඇති විය. හස්ත කර්මාන්තය කෘෂිකර්මාන්තයෙන් වෙන් කරන ලදී. නිෂ්පාදනයේ නොකඩවා වැඩීම සහ ඒ සමඟම ශ්‍රම පලදාව වැඩි වීමද නිසා මිනිස් ශ්‍රම ශක්තියේ වටිනාකම වැඩි විය. මීට පෙර අවධියේ ක්‍රමයෙන් වැඩී ආ විරල සාධකයක්වූ වහල් ක්‍රමය දැන් සමාජ ක්‍රමයේ අවශ්‍ය ාටසක් විය. වහලුන් තව දුරටත් හුදු ආධාරකරුවා නොවිය. වහලුන් කාණ්ඩ වශයෙන් ගොවිපළවල හා වැඩපොළවල වැඩ කිරීම සඳහා යොදන ලදී. නිෂ්පාදනය කෘෂිකර්මාන්තය සහ කර්මාන්තය වශයෙන් විශාල අංශ දෙකට බෙදී යාම නිසා හුවමාරුව සඳහා නිපදවීම එනම්, හුවමාරු භාණ්ඩ නිපදවීම ඇති විය. ඒ සමඟම අභ්‍යන්තර හා ගෝත්‍ර සීමා තුළ පමණක් නොව විදේශ අතරද වෙළෙඳාම ආරම්භ විය. මේ සියල්ලම අතිශය දියුණු තත්ත්වයක තිබිණි. වටිනා ලෝහ වර්ග මුදල් භාණ්ඩය වශයෙන් අනුග්‍රහයක් ලැබුවේය. එහෙත්, එය කාසි මෙන් අච්චු ගසා නොතිබුණු අතර, බර අනුව හුවමාරු කර ගන්නා ලදී**

**(එංගල්ස් - පවුල පෞද්ගලික දේපල හා රජය ඇතිවූ සැටි , 164 පිටුව.**